# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1800/25 - 2013 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2013.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රජයේ රේගු නිවේදනය

රේගු ආඥාපනතේ (235 අධිකාරිය) 111 වගන්තිය යටතේ වන නියෝගය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, රේගු ආඥාපනතේ (235 අධිකාරිය) 111 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1938 ගුවන් සන්තරණ රෙගුලාසි අංක 09 ට යටත්ව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි මත්තල ග්‍රාමය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගුවන් තොටුපළක් විය යුතු බව සහ එහි සීමාවන් මෙහි උපලේඛනය "අ" හි සඳහන් කර ඇති පරිදි වියයුතු බව මෙම නියමය මගින් නියම කර ප්‍රකාශයට පත්කරමි. තවද, උපලේඛනය "ආ" හි සඳහන් කර ඇති ස්ථාන එහි සඳහන් සීමාවන් තුළ, ගුවන් මගීන් ගුවන් යානාවලට නංවාගැනීම සහ ගුවන් යානාවලින් ගොඩබෑම ගුවන් තැපැල් භාණ්ඩ සහ අනෙකුත් භාණ්ඩ ගුවන්යානා වලට පැටවීම හා ගොඩබෑම සඳහා වන නීත්‍යානුකූල ගුවන් තොටුපලක් වියයුතු බව සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සීමාව තුල එම ගුවන් තොටුපළ මායිම් සහ ප්‍රමාණයන් උපලේඛනය "අ" "ආ" හා "ඇ" හි සඳහන් පරිදි විය යුතු බව ප්‍රකාශයට පත්කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය)

2013 ක් වූ මාර්තු මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

එහි උපලේඛනයන් ''අ'', ''ආ'' සහ ''ඇ'' යන්න වශයෙන් පහතින් විස්තර වේ.

''අ'' උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම්පත්තුව සුළු කොට්ඨාසයේ තම්මැන්නාව, කැටන්වැව, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තම්මැන්නාව කුරුදාන ග්‍රාමයේ පිහිටි රජයේ මැනුම්පති විසින් 2012 මාර්තු මස සහ සමාංක ජාතික සිතියම් යොමුවේ ක්ෂේත්‍ර අංක E.D.M. හ 2825, E.D.M. හ 2950, අවසාන භූලක්ෂණාත්මක පිඹුරු අංක 03 අතුරු පිඹුරු අංක 369, පත්‍ර අංක 405 රේඛා චිත්‍ර අංක L/හ 519 හි කැබලි අංක A1408, 1409 සහ 1411 යන කැබලි සහ අතිරේක අංක 7 ක්ෂේත්‍ර පත්‍රයේ අවසාන ගම්පිඹුරු 575 හි පිඹුරේ කැබලි අංක 177 ලෙස දක්වා ඇති බිම් කොටස් මැන සකස් කරන ලද බිම් කොටස්වල මායිම් තුළ පිහිටි හෙක්ටයාර් දෙසිය අසූඅටයි දශම හතයි තුනයි පහයි දෙකක් විශාල (288.7352 ha) විශාල කුරුදාන කැලේ ඉඟිනියන්ගහහේන, ජම්බුගහහේන සහ පලෙකුරුදාන වැල්කටුව නැමති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් කැබලි සම්පූර්ණයෙන්ම වේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

A 1408 උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම්පත්තුව සුළු කොට්ඨාසයේ තම්මැන්නාව, කැටන්වැව, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තම්මැන්නාව කුරුදාන ග්‍රාමයේ කුරුදාන කැලේ නැමති ඉඩමට රජයේ මැනුම්පති විසින් 2012 මාර්තු මස සහ සමාංක ජාතික සිතියම් යොමුවේ ක්ෂේත්‍ර අංක E.D.M. හ 2825, E.D.M. හ 2950, අවසාන හුලක්ෂණාත්මක පිඹුරු අංක 03 අතුරු පිඹුරු අංක 369, පත්‍ර අංක 405 රේඛා චිත්‍ර අංක L/හ 519 හි කැබලි අංක A 1408 මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක A 1413 ද ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක A 1413 ද ; |
| *දකුණට* | : | කැබලි අංක A 1413 අවසාන ගම් පිඹුරු 575 කුරුදාන ද ; |
| *බටහිරට* | : | අන්තිම ගම්පිඹුරු 575 කුරුදාන ද, යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් හැටතුනකුත්, හෙක්ටයාරයෙන් දසදහසෙන් නවදහස් තුන්සිය පනස්හතරක් පමණ භූමිය ද, (63.9354 ha). |

අවසාන හුලක්ෂණාත්මක පිඹුරු අංක 03 කැබලි අංක 1409 ට මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අවසාන ගම්පිඹුරු අංක 575 කුරුදාන ද ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක A 1413 ද ; |
| *දකුණට* | : | කැබලි අංක A 1410 සහ A 1413 ද ; |
| *බටහිරට* | : | කැබලි අංක A 1410 සහ අවසාන ගම් පිඹුරු 575 හි කුරුදාන ද, යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් හතරකුත් හෙක්ටයාරයෙන් දස දහසෙන් එක්දහස් තුන්සිය අනූහතක් (4.1397 ha) භූමිය ද. |

අවසාන හුලක්ෂණාත්මක පිඹුරු අංක 03 කැබලි අංක A 1411 ට මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක A 1412 සහ අවසාන ගම් පිඹුරු 575 කුරුදාන ද ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක A 1410 ද ; |
| *දකුණට* | : | කැබලි අංක A 1410 සහ අවසාන A 1413 ද ; |
| *බටහිරට* | : | කැබලි අංක A 1413, A 1412 සහ අවසාන ගම් පිඹුරු 575 කුරුදාන ද, යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් දාහතකුත් හෙක්ටයාරයෙන් දස දහසෙන් එක්දහස් තුන්සිය තිස් හතකුත් (17.1337 ha) මායිම් තුළ පිහිටි සියලු භූමි ප්‍රමාණය ද. |

මුළු එකතුව හෙක්ටයාර් අසූපහකුත් හෙක්ටයාරයෙන් දසදහසෙන් දෙදාස් අසූඅටක් (85.2088 ha) සමග ද වේ.

"ආ" උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම්පත්තුව සුළු කොට්ඨාසයේ තම්මැන්නාව, කැටන්වැව, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තම්මැන්නාව කුරුදාන ග්‍රාමයේ කුරුදාන කැලේ ඉඟිනියන්ගහහේන, ජම්බුගහහේන, පලෙකුරුදාන වැල්කටුව ඉඩමේ පිහිටි රජයේ මැනුම්පති විසින් 2012 අප්‍රේල් මස 09 වන දින සමාංක ජාතික සිතියම් යොමුවේ ක්ෂේත්‍ර අංක EDM හ 2825, EDM හ 2950, අවසාන ගම් පිඹුරු අංක 575 අතිරේක පිඹුරු අංක 07, පත්‍ර අංක 07 රේඛා චිත්‍ර අංක L/හ 520 හි කැබලි අංක 177 ට මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 178 සහ අවසාන භූමි පිඹුරේ 3 පහළ මත්තල තම්මැන්නාව ද ; |
| *නැගෙනහිරට* | : | අවසාන භූමි පිඹුර 3 පහළ මත්තල, තම්මැන්නාව සහ කැබලි අංක 179 ද ; |
| *දකුණට* | : | අවසාන භූමි පිඹුරු අංක 3 හි කුරුදානද සහ කැබලි අංක 180 ද ; |
| *බටහිරට* | : | කැබලි අංක 180, 181, 27, 28, 26 C , 475 B, 2, 8, 7 සහ 178 ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් දෙසිය තුනකුත් හෙක්ටයාරයෙන් දස දහසෙන් පන්දහස් දෙසිය හැටහතරක් (203.5264 ha) යන භූමිය ද වේ. |

"ඇ" උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාගම්පත්තුවේ පහළ මත්තල යන ගමේ පිහිටි රජයේ මැනුම්පති විසින් මැන සාදවා සකස් කරන ලද අංක 406 වැනි ක්ෂේත්‍ර පත්‍රයේ අවසාන භූමි පිඹුරු අංක 03 හි දක්වා ඇති A 1414 බිම් කොටසට මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක A 1415 ද ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක A 1415 ද ; |
| *දකුණට* | : | කැබලි අංක A 1415, A 1408, සහ අවසාන ගම්පිඹුරු 575 කුරුදාන ද ; |
| *බටහිරට* | : | කැබලි අංක A 1408 අවසාන ගම් පිඹුරු 575 කුරුදාන සහ A 1415 යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් පන්සිය එකොළහයි හෙක්ටයාරයෙන් දසදහසෙන් දෙදහස් හයසිය හතලිස් අටක් (511.2648 ha) විශාල ලුණුගම්වෙහෙර කැලේ නැමති ඉඩම් භූමිය ද මේ සමග වේ. |

ඉහත උපලේඛන අ,ආ,ඇ යන මුළු භූමි ප්‍රමාණයන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලේ රේගු සීමාවන් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

03 - 1076

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.